# ඉන්දුනීසියාවේ බාලි දූපත පෙබරවාර් 2019

## සම්පත් වීරවර්ධන

## අතරමග නවාතැන

ලංකාවට යන එන ගමන් මේ අත්දැකීමත් ලබන්න.

ලංකාවට යන එන ගමන්, දවස් දෙක තුනක් විදෙස් රටක ගොඩ බැහැලා ඒ අපූරු අත්දැකීමත් විදගන්න අවස්ථාවක් තිබුනොත්, ඒ නිවාඩුව කොයිතරම් සුන්දර වෙයිද? අතරමග නවාතැන විශේෂාංගයේ මේ මාසෙ අපි කතා කරන්නේ දින තුනක් වැනි ඉතාමත්ම සුළු කාල සීමාවක් තුළ ඔස්ට්‍රේලියානුවන් අතර බොහෝ ජනප්‍රිය ඉන්දුනීසියාවේ බාලි දූපතේ සංචාරය කරන ආකාරයයි.

තමන්ටම ආවේණිකව වු හින්දු ආගමික සම්ප්‍රදායන් සමූහයකින් පෝෂණය වූ බාලි සංස්කෘතිය මෙන්ම, ස්වභාව සෞන්දර්යයෙන් පිරිපුන් බාලි දූපත දින තුනකින් පූර්ණ වශයෙන් විඳ ගැනීමට කිසිසේත්ම හැකියාවක් නැති බවත් මුලින්ම සිහිපත් කල යුතුය. එහෙත් මෙය ඔබේ ප්‍රථම බාලි සංචාරය නම් එවන් කෙටි සංචාරයකට මාගේ අත්දැකීම් ඔබට වැදගත් වේවි යැයි මාගේ විශ්වාසයයි .

### ප්‍රථම දිනය

බාලි දූපතේ සංචාරකයන් පිරී ඉතිරී ඇති ප්‍රදේශයක් තමයි Kuta or Seminyak ප්‍රදේශය.

සුන්දර වෙරළ තීරයක්, බාලීවාසි සංස්කෘතිය හා සබැඳුණු විවිධ සමරු භාණ්ඩ වෙළඳ කුටි වගේම ඉන්දුනීසියානු සහ ජාත්‍යන්තර ආහාර පාන අලෙවිසැල් සම්භාහන ආයතන පවා බහුල වශයෙන් පිහිටා ඇති මේ ප්‍රදේශය Denpasar ජාත්‍යන්තර ගුවන් තොටුපල ආසන්නයේම පිහිටා තිබීමත් ඔබට ඉතා වැදගත් වේවි. එමෙන්ම ඔබ Nightlife ගැන උනන්දුවක් දක්වනවානම් Seminyak ප්‍රදේශයේ Night Club ආශ්‍රිත විනෝද ක්‍රියාකාරකම් සඳහා වැඩි ප්‍රසිද්ධියක් උසුලනවා. ඔබට අවශ්‍ය නම් මුළු රාත්‍රියම නොනිදා පහන් කල හැකි තරම් වු විවිධ මාදිලියේ Night Club වලින් මේ ප්‍රදේශයේ පිරී තිබෙනවා. එපමණක්ද නොවෙයි. මී ලග දින දෙක තුල ඔබට මේ ලිපියේ සදහන් නොවන Tour එකක් යාමට අවශ්‍ය නම් ඒ සඳහා ඕනෑවටත් වඩා විවිධ Tour Boking. ඒකකි ණඩඒ සහ Seminyak ප්‍රදේශවල පිහිටා තිබෙනවා. සංචාරකයන් බහුල වශයෙන් ගැවසෙන ප්‍රදේශයක් නිසා දවසේ පැය 24 තුළම Taxi සහ Hotel පහසුකම ලබාගැනීමටත් හැකියාවක් තිබෙනවා.
එමෙන්ම ඔස්ට්‍රේලියානු ඩොලර් සඳහා වැඩි වටිනාකමක් ලබාගැනීමට Money Exchange සේවා පවා මේ ප්‍රදේශයේ බහුලව තිබෙන බවත් මතකයේ තබා ගන්න.




### දෙවන දිනය

දෙවන දිනය Canggu හෝ Uluwatu සඳහා වෙන් කිරීම වඩාත් යෝග්‍ය බව මාගේ අදහසයි.

Canggu අඳුරු පැහැති වැල්ලෙන් පිරි වෙරළ තීරයකට හිමිකම් කියනවා. ඔබ Surfing පිළිබඳව සුළු හෝ උනන්දුවක්




ඇත්නම් මේ ප්‍රදේශය ඒ සඳහා වඩාත් සුදුසුයි. එසේත් නැතිනම් බොහෝ සංචාරකයන් මෙන් වෙරළ තීරයේ සුන්දරත්වය විඳගනිමින් එහි පිහිටි විවිධ Café වල ගිමන් නිවාගැනීමටත් ඔබට අවස්ථාව තිබෙනවා. අනතුරුව පහලොස් වන ශත වර්ෂයේ නිර්මාණය වු බවට පිළිගැනෙන Tanah Lot සිද්ධස්ථානය නැරඹීමටත් කාල වේලාව වෙන්කර ගන්නට ඔබට පුළුවන්. විශේෂයෙන්ම සන්ධ්‍යා භාගයේ හිරු බැස යද්දී Tanah Lot සහ ඒ අවට ඇති සමුද්‍රාශ්‍රිත ගල්පර වල සිට සොබාදහමේ අතිශය චමත්කාර ජනක දර්ශන නැරඹීමටත් බොහෝ දෙනා ප්‍රිය කරනවා.

මේ සිද්ධස්ථානයට ඇතුළුවීම් ගාස්තුව විදේශිකයෙකුට රුපියල් 60,000 ක් (ළමුන් සඳහා 30,000 ක්) වෙනවා. එය ඉන්දුනීසියානුවන් ගෙවන ප්‍රමාණය මෙන් තුන් ගුණයක් බවත් සඳහන් කිරීම අවශ්‍යයි.

ඔබ Tanah Lot ගැන එතරම් උනන්දුවක් නොදක්වන්නේ නම් සුන්දර බාලි පරිසරය විඳගැනීමට ඇති තවත් ප්‍රසිද්ධ ස්ථානයක් ලෙස Uluwatu හැඳින්විය හැකිය. Uluwatu සිද්ධස්ථානය වටා වඳුරන් බහුල වශයෙන් ගැවසෙන වනාන්තරයක් ඇති නිසා සමහර සංචාරකයන් එහි යාමට මඳක් අදිමදි කරන්නට පවා පෙළඹෙනවා . අව් කණ්නාඩි, කැමරා බෑග් එල්ලෙන කරාබු වැනි දේ රැගෙන දිවීමට පවා මේ වඳුරු පිරිවර අති දක්ෂ බව සඳහන් කළ යුතුමයි. මෙහි පැමිණෙන වැඩි දෙනා එම වඳුරු ප්‍රහාරයන්ට කල්තියාම සූදානම් වී පැමණීම දැකගත හැකිය. Uluwatu

